

# “වලවේ නදී මිටියාවත වන අරණ”

## උඩවලව ජාතික වනෝද්‍යානය

ශ්‍රී ලාල් නිශාන්ත හෙට්ටිආරච්චි

සුළඟේ වේගයට සිහින් රළි නංවමින් තාවුල මත පෙන කැටි නන්වමින් ජල කඳ රහඳෙයි. හිරු රැසට ඔද වඩන එම ජල රළි වරෙක රන් පැහැයෙන් ද වරෙක රිදී පැහැයෙන් ද නෙත් සිත් සනහාලයි. සතර අතින් වට වූ කඳු අතුරින් ගිලිහී පැන එන සුළං දහරා ජලාශයේ ජල කඳ පීරා රැගෙන එන මීදුම් ආකාර ජල බිඳිති ගතට දනවන සිසිල සිත පතුලටම කිඳා බසී. මේ සියළු චමත්කාරයන්ට පනපොවන මහා ජලාශය ජීවී අජීවී කොයි කාටත් සෙත සදමින් විරාජමානව තම අභිමානය රටට කියාපාමින් ඔද වඩයි. මේ අන්කිසිවක් නොව උඩවලව ජලාශයයි.

උඩවලව ජලාශය ශ්‍රී ලංකාවේ පිහිටි බහුකාර්යය ජලාශ අතුරින් ප්‍රමුඛස්ථානයක් ගන්නකි. කෘෂිකාර්මික අරමුණු හා ජල විදුලිබල නිෂ්පාදනය මේ අතුරින් ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3400ක් පුරා පිහිදී ඇති උඩවලව ජලාශය උතුරු අක්ෂාංශ $6^0$ 27' හා නැගෙනහිර දේශාංශ 80 50 අතර පිහිටා ඇත.

උඩවලව ප්‍රදේශය සහ වලවේ ගඟ ඓතිහාසික සිද්ධීන් මෙන්ම පැරණි වාරි ඉතිහාසයකට ද උරුමකම් කියන ප්‍රදේශයකි.

ගජබා රජුගේ ප්‍රධාන සෙනෙවියෙකු වූ නීල මහා යෝධයා උඩවලව ප්‍රදේශයට පැමිණි බවත්, කල්තොටින් වලවේ ගඟ හරස්කොට වේල්ලක් බැඳ සමස්ථ ප්‍රදේශයම කෘෂිකාර්මිකව සශ්‍රික කල බවත් ඉතිහාසයේ සඳහන් වේ.

වලවේ ගඟ ආරම්භ වන්නේ ලංකාවේ දෙවෙනියට උසම කන්ද වන (2395) හෝර්ටන් තැන්නේ පිහිටි කිරිගල් පොත්ත කන්දෙනි. එතැන් සිට දිගු ගමනක් අරඹන වලව ගඟ දකුණේ අම්බලන්තොටින් මුහුදට වැටෙයි. මේ අතරතුර වලවේ ගඟෙන් පෝෂණය ලබන අතු ගංගා ජලාශ, වනාන්තර හා කෘෂිකාර්මික ප්‍රදේශ බොහෝය. ඒ අතුරින් උඩවලව ජලාශයට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. ජලාශයේ තත්ත්වය සැකෙවින් පහත ආකාර වෙයි.

| | |
|---|---|
| ජල රැඳවුම් ධාරිතාව | - අක්කර අඩි දෙලක්ෂ දාහත්දාහයි. (2,17,000) |
| වේල්ලේ වර්ගය | - Rolled Earthfill |
| වේල්ලේ උපරිම උස | - මීටර් 36.75 |
| වේල්ලේ දිග | - කි. මී 4. 9 |
| වේල්ලේ ඇති සොරොව් කවුලු ගණන | - 05 කි |
| දකුණු ඇලේ දිග | - සැතපුම් 26 |
| වම් ඇලේ දිග | - සැතපුම් 25 |
| විදුලි උත්පාදක ධාරිතාව | - මෙගවොට් 6 |
| ජලාශයෙන් පෝෂණය වන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය | - හෙක්ටයාර් 18,000 |

ඉහත පෙන්වා දෙනු ලැබුවේ ජලාශයේ භෞතික තත්ත්වයෙන් සමහරකි. උඩවලව ජලාශය එක්දහස් නවසිය හැත්තෑ එකේ පිහිටුවීමෙත් සමග එහි ජලපෝෂක ප්‍රදේශය ලෙසින් විශාල භූමි ප්‍රමාණයක් වෙන් කරන ලදී. තුරුලියෙන් පිරීමේ බිම අන්කිසිවක් නොව උඩවලව ජාතික වනෝද්‍යානයයි.

### වනෝද්‍යානය හා සම්බන්ධ ඉතිහාසය

උඩවලව ජාතික වනෝද්‍යානය ලෙසින් වර්තමානයේ හඳුන්වන භූමිය සහ සම්බන්ධ අතීතය ද පරතෙරට ගියා වූවකි. ගජබා රජදවස නීලමහා යෝධයා මෙම ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවලට තිරතවූවේ යැයි සඳහන් වේ. තවද මේ ආශ්‍රිතව හා වනෝද්‍යාන භූමිය තුළ පිහිටි සමහරක් ස්ථාන මෙහි අතීත ශ්‍රී විභූතිය මනාව පිළිබිඹු කරයි. වනෝද්‍යානය තුළ පිහිටි වෙහෙර මංකඩ හා වෙහෙර ගොල්ල යන ස්ථානයන්හි නටඹුන් ගොඩනැගිලි හා ගල්කණු කොටස් හමු වී ඇත. මෙහි පණහඩුව ග්‍රාමය ආසන්නයේ පිහිටි රෙමිණි කොත ද නටඹුන් වෙහෙරකි. මේ ආශ්‍රිතව ඇති සංඛපාල විහාරය හා ඔබරගල ආරණ්‍යය ද දුටුගැමුණු රජ සමයටත් එයටත් එපිට ඉතිහාසගත උරුමයන්ටත් සාක්ෂි කරයි.

වනෝද්‍යාන මායිමේ පිහිටි කල්තොට හා සඳගිරිය යන ප්‍රදේශ අතීතයේ රාජධානි වශයෙන් පැවත ඇති බවට සාධක හමුවන අතර සඳගිරියේ දළදා මාලිගාවක් ද පැවති බව පුරාදවිද්‍යා නිදර්ශක අනුව පෙනී යයි.



වර්තමාන වනෝද්‍යාන භූමියේ 1972න් එපිට පිහිටි ගම්මාන ද වෙති. සීනුග්ගල හා මුවංපැලැස්ස, නැබඩ ඒ අතර පිහිටි සශ්‍රික ගම්මාන තුනකි. සීනුග්ගල ගම පිහිටි ප්‍රදේශයේ අතීතයේ එහි රෝපණය කිරීමට යෙදුනු පොල්, කොස් ඇතුළු ගෘහාශ්‍රිත ගස්වර්ග සරුවට වැඩී ඇති අයුරු දැනු ද දැකගත හැකිය. මෙම භූමිය වනෝද්‍යාලයක් ලෙස ස්ථාපිත කිරීමේ දී මෙහි විසූවන්ට නැවත ඉඩම් ලබා දී මෙයින් ඉවත් කර ඇත.

නිසියාකාර පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් මෙහි සිදුකර නොමැති මුත් මේ ආශ්‍රිතව පවතින පුරා විද්‍යාත්මක නටඹුන් හා ඓතිහාසික පුරාවෘත්ත බොහොමයක් සොයාගත හැකිය. ඒ සියල්ල කැටිකරගත් විට මේ ආශ්‍රිතව ප්‍රෞඪ ඉතිහාසයක් පැවති බවට නම් සක් සුදක් සේ විශ්වාසය.

## වනෝද්‍යානයේ වර්තමාන තත්ත්වය

උඩවලව ජලාශය ඇතිකිරීමෙන් පසුව එහි ජල පෝෂක ප්‍රදේශය වශයෙන් ද ප්‍රදේශයේ අලි ඇතුන් ඇතුළු වන සතුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම ද අරමුණු කරගෙන 1972 ජූනි මස 30 දා, ගැසට් අංක 14 යටතේ හේක්ටයාර 30,821 ක භූමි ප්‍රමාණයක් වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත මගින් ජාතික වනෝද්‍යානයක් ලෙසින් ප්‍රකාශයට පත් කරන ලදී. එලෙසින් ප්‍රකාශයට පත්වූ උඩවලව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශාල කීර්තියක් ලබා ඇති වනෝද්‍යානයකි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන උඩවලව වනෝද්‍යානය වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත යටතේ පවතින නීතිරීති වලට අනුකූලව පාලනය වෙයි.

## පිහිටීම හා පිවිසුම

වනෝද්‍යානය සබරගමුව හා දකුණු පළාත් දෙකටත්, රත්නපුර හා මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකටත් පරිපාලනමය වශයෙන් මායිම් වේ. ප්‍රදේශීය ලේකම් බල ප්‍රදේශ වශයෙන් සලකා බැලූ කල බලංගොඩ, තණමල්විල ඇඹිලිපිටිය හා වැලිගෙපොල යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 04 ට වනෝද්‍යානය මායිම්ව පිහිටා ඇත.

අක්ෂාංශගත පිහිටීම අනුව ගත්කල උතුරු අක්ෂාංශ $6^0$ 25' - $6^0$ 35' හා නැගෙනහිර දේශාංශ $80^0$ 45' - $81^0$ -00' අතර පිහිටා ඇත. උඩවලව

උඩවලව වනෝද්‍යානයේ සිතියම හා එය ආශ්‍රිත ප්‍රදේශය





වනෝද්‍යානයට ප්‍රකාශයට පත් කිරීමේ දී එහි මායිම් වශයෙන් නම්කර ඇති සීමා ද කීපයකි.

| | |
|---|---|
| උතුරින් | - කුයිලින්ද ආර, කටුපත් ඔය හා දියවිනි ඔය |
| දකුණින් | - උඩවලව තණමල්විල ප්‍රධාන මාර්ගය |
| නැගෙනහිරින් | - පොකුණුතැන්න, කවුඹිලි ආර මට්ආර, බෙල්ලන්ගල කඳු වැටිය හා වෙහෙරගල |
| බස්නාහිරින් | - කොළඹගේ ආර, පනහඩුව, ගල්පාය හා වෙලංකැටිය |

## භූගෝලීය තත්ත්වය

වනෝද්‍යානය මුහුදු මට්ටමේ සිට මීටර 60-400 අතර උච්චත්වයකින් පිහිටා ඇත. මෙම උච්චත්ව පරාසයන් අතර තුර තැනිතලා බහුල අතර අතරින් පතර ඉහළට එසවුණ හෙල්, කඳු හා උස්ගල් තලා ද වෙති. වනෝද්‍යාලයට උතුරු දෙසින් කල්තොට, බෙල්ලන්ගල කඳුවැටිය පිහිටා ඇත. බටහිරින් උල්ගල කන්දද, වනෝද්‍යානය තුළ රෙමිණි කොත, තාලිගල ආදී ගල් ශිඛර දැකගත හැකිය. තවද උද්‍යානයේ බටහිර මායිමේ බඹරගල හා සංඛපාල යන කඳුවැටි පිහිටා ඇත.

වනෝද්‍යානය ආශ්‍රිත භූ විද්‍යාත්මක තත්ත්වයන් පිළිබඳ සලකා බැලීමේ දී විශාල විවිධත්වයක් දැකගත හැකිය. මෙහි විජයානු ශ්‍රේණියට (Vijayan serics) අයත් ප්‍රාක් ක්‍රේම්බ්‍රිජීය (Precambrian) පාෂාණ දැකගත හැකිය. මෙම පාෂාණයන්හි ක්වාට්ස් හා පෙල්ස්පා ඇතිවිට අළු සුදු පැහැයෙන් ද දැකගත හැකිය. මෙහි පාෂාණයන්හි නිමැවුම් සංඝටක ආකාර කීපයකි. ගානට් ගණය, ගානට් හා බයෝටයිඩ් ගණය, ක්වාර්ට්ස් ග්‍රැනිටික් ගණය, කිරිගරුඩ, චර්නොකිට් ගණය ඒ අතුරින් ප්‍රමුඛස්ථානයක් ගනී.

වනෝද්‍යානය ආශ්‍රිතව ඇති පස් කාන්ඩ අතර වලව ශ්‍රේණිය හා මලබටු (Walawa series) ශ්‍රේණියේ (Malabatu series) පස් බාණ්ඩ ප්‍රමුඛ වේ. සමස්තයක් වශයෙන් මෙහි රතු දුඹුරු පස ප්‍රමුඛත්වයක් ගන්නා අතර, ගංගා නිම්න හා ජලාශ්‍රිත ප්‍රදේශ ආශ්‍රිතව අළුවියළි පස දැකගත හැකිය.

## දේශගුණික තත්ත්වය

උඩවලව වනෝද්‍යානය තෙත් හා වියළි ස්වභාවය ගන්නා දිස්ත්‍රික්ක 02 කට මායිම්ව පිහිටා ඇති බව පෙර සඳහන් කරන ලදී. රත්නපුර දිස්ත්‍රික්කයට මායිම් වන භූමි ප්‍රමාණය සාපේක්ෂවන අඩු වුව ද එහි තෙත් කලාපීය ගති ලක්ෂණ දැකගත හැකිය.

උද්‍යානයේ වැඩි භූමි ප්‍රමාණයක් මොණරාගල දිස්ත්‍රික්කයට අයත්ව පිහිටා ඇත. එම ප්‍රදේශය සාපේක්ෂව වියළි ස්වභාවයක් ගනී. කෙසේ වුවද මෙහි අතර මැදි කලාපීය දේශගුණික තත්ත්වයක් දැකගත හැකිය.

අප්‍රේල් මැයි යන මාසයන්හි නිරිත දිග මෝසම් ද, ඔක්තෝබර්, නොවැම්බර් මාසයන්හි ඊසාන දිග මෝසම් සුළඟින් ද වනෝද්‍යානයට වර්ෂාව ලැබෙයි. සැප්තැම්බර් මසයේ දී අන්තර්මෝසම් මගින් වර්ෂාව ලැබෙයි. සමස්ත වශයෙන් ගත්කල මෙහි වාර්ෂික වර්ෂාපතනය මි. මී. 1524 ක් ලෙස ගණනය කර ඇත. කෙසේ නමුදු පෙබරවාරි, මාර්තු හා මැයි අග සිට සැප්තැම්බර් දක්වා මෙහි වර්ෂාව නොමැති හෙයින් වියළි ස්වභාවයක් දැකගත හැකිය.

වනෝද්‍යානය ආශ්‍රිතව උෂ්ණත්වය විචල්‍යත්වයේ ද පැහැදිලි වෙනස්කමක් දැකගත හැකිය. දැනට මෙහි සිදුකර ඇති අධ්‍යයන අනුව අවම උෂ්ණත්වය 17.7 හා උපරිම උෂ්ණත්වය 37.2 ලෙස ගණනය කර ඇත. මෙහි වැඩි වශයෙන් පවතින මධ්‍ය උෂ්ණත්වය 29.4 ලෙස පෙන්වා දිය හැකිය.

වනෝද්‍යානයේ ආද්‍රතාවය 94% - 95% ක් පමණ වේ. මෙහි සුළං හමන වේගය පිළිබඳව සිදුකර ඇති අධ්‍යයනයන්ට අනුව මැයි 5, 9 ජුනි 6.3 හා ජූලි 5.7 පැයට කිලෝමීටර වේගයකින් සුළං හමා යයි. අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් කාලයන්හි දී සුළඟේ වේගය සාපේක්ෂව අඩුය. මේ අනුව අවම සුළං වේගය පැයට කිලෝමීටර 3.1 ලෙසින් නොවැම්බර් මස ද වැඩිම සුළං වේගය පැ. කි. 6.3 ලෙසින් ජුනි මස ද නිරීක්ෂණය කළ හැකිය.







## වනෝද්‍යානය ආශ්‍රිත ජලවහන රටාව

මෙහි ඇති ප්‍රධාන ගංගාව වලවේ ගඟයි. දෙවෙනියට මව් ආර වැදගත් ස්ථානයක් හිමිකර ගනී. වලව ගඟ හරස් කොට උඩවලව ජලාශය ද මව්ආර හරස්කොට ගල් අමුණ වැව හා හම්බෙගමුව වැව ගොඩනගා ඇත. වනෝද්‍යානයේ බටහිර මායිමෙන් වලව ගඟ ද, නැගෙනහිර මායිමෙන් මව්ආර ද ගලා බසී. උද්‍යාන භූමියෙන් වර්ග කිලෝමීටර 1155ක් පුරා වලව ගඟ ව්‍යාප්තව ඇත. වලව ගඟට අතු ගංගා ගණනාවක්ම එකතු වෙයි. ඒවා නම්, කුඩා ඔය, කිවුල් ආර, කටුපත් ඔය, මළකඳුර ආර, මවු ආර, හබරලු ආර, කවුඩිලි ආරයි.

වනෝද්‍යානයේ සීමාවේ ඇති මව් ආරෙන් පෝෂණය වන හම්බෙගමුව වැව ද, කුඩා ඔයෙන් පෝෂණය වන කලවැල්ල ගල වැව ද සාපේක්ෂව විශාල වැව් වන අතර ඉඩොර කාලයට ද ජලය රඳා පවතී.

වර්තමාන වනෝද්‍යාන භූමිය අතීතයේ ජනාවාස වී පැවති බිමක් ලෙස පෙර සඳහන් කරන ලදී. මෙම වකවානුවේ දී එහි විසූ ජනයා සිය කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදිකළ කුඩා ප්‍රමාණයේ වැව් හා පොකුණු කිපයක් ද මෙහි දැකගත හැකිය. සීනුන්ගල වැව, මුවන් පැළැස්ස වැව, දන්ගහ වැව, කුඩා වැව, බුරුතගොල්ල වැව, තේක්ක වැව මේ අතුරින් ප්‍රධානත්වයක් ගනී.

වලව ගඟ සහ අතු ගංගා




## වනෝද්‍යානය ආශ්‍රිත සමාජාර්ථික පසුබිම

උඩවලව ප්‍රදේශය අතීතයේ සිටම සශ්‍රීක කෘෂිකාර්මික පසුබිමක් පැවති ප්‍රදේශයකි. මඩ ගොවිතැන ලෙස වී වගාව මෙන්ම ගොඩ ගොවිතැන ලෙස හේන් වල තල, මෙනේරි, කුරක්කන්, බඩඉරිඟු ඇතුළු එළවලු වර්ග ද වගා කරති. මෙයට අමතරව මෙහි ගව පාලනය ද ඉතා සාර්ථකව සිදු කරති. මී කිරි මෙන් ම එළකිරි අලෙවිය ද මෙහි ගොවීන්ගේ එක් ආදායම් මාර්ගයකි. අමතරව ජලාශයේ ධීවර කර්මාන්තයේ යෙදෙන සුළු පිරිසක් ද වෙති.

ශ්‍රී ලංකාවේ දැනට පවතින වනෝද්‍යාන 14 අතුරින් උඩවලව ඒ වටා පිහිටි ගම්මාන ප්‍රමාණය සම්බන්ධයෙන් විශේෂත්වයක් ගනී. ලංකාවේ වනෝද්‍යානයක් වටා පිහිටි වැඩිම ගම්මාන ප්‍රමාණය මෙය වටා පිහිටයි. එය සංඛ්‍යාත්මකව 52කි.

මේ හේතුව නිසාවෙන් වනෝද්‍යානයට ඇතිවන මානව බලපෑම් ද, වන සතුන්ට සිදුවන බලපෑම් හා අලි ඇතුන්ගෙන් ගම්වාසීන්ට හා ඔවුන්ගේ දේපළ සඳහා ඇතිවන බලපෑම් ද සාපේක්ෂව ඉහළ අගයක පවතී.

පරිපාලනමය වශයෙන් වනෝද්‍යානය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය 04 ට අයත් වන බව පෙර සඳහන් කරන ලදී. ඒවා පිළිබඳ විස්තර පහත ආකාර වගුවක් ලෙස පෙන්වාදිය හැකිය.



| ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශය | ග්‍රාමසේවා වසම් ගණන | පවුල් සංඛ්‍යාව | ජනගහනය |
|---|---|---|---|
| බලංගොඩ | 40 | 20020 | 108323 |
| වැලිගෙපොල | 30 | 6788 | 30096 |
| තණමල්විට | 33 | 13012 | 57329 |
| ඇඹිලිපිටිය | 53 | 16397 | 77025 |

වනෝද්‍යානය ආශ්‍රිත ගම්මානයන්හි වෙසෙන ජනතාවගෙන් බහුතරය සිංහල බෞද්ධයන්ය. මෙහි සමහර ගම්මානයන්හි පවතින සංස්කෘතික අංග ඇදහිලි හා විශ්වාස ආදිය වලට නිම්නයටම ආවේණික වීම විශේෂිතය.

### වනෝද්‍යානය ආශ්‍රිත ශාක ප්‍රජාව

උඩවලව වනෝද්‍යානය පිහිටි සීමාව භූගෝලීයව මෙන්ම දේශගුණික වශයෙන් ද අතර මැදි කලාපයට අයත්ව පිහිටා ඇත. මෙහිබහුල වනාන්තර ආකාරය වියළි අන්තර් මෝසම් වනාන්තරයි. එහෙත් වලව ගඟ සීමාවේ දී හොඳින් සදාහරිතව වැඩුණු ගස් ද දැකගත හැකි අතර, මේවා ගංගාධර වනාන්තර ස්වරූපය ගනී. අතීතයේ වනෝද්‍යානයට අයත් සීමාවේ සරුවන වැස්මක් පැවත තිබුණ ද එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල හේන් වගාව සඳහා මෙම භූමි පැවරීම හේතුවෙන් විශාල වශයෙන් වනාන්තර එළිපෙහෙළි වී පරිසරය ට හානි සිදු වී ඇත. එසේ එළිපෙහෙලි වූ භූමි වර්තමානයේ වි ශාල තෘණ භූමි ලෙසින් දැකගත හැකිය. මෙම වනෝද්‍යානයේ ශාක ප්‍රජාව පිළිබඳව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේලෝක පරිසර පහසුකම් ව්‍යාපෘතිය මගින් සිදුකළ අධ්‍යයනයේ දී මෙහි ශාක ව්‍යාප්තිය පිළිබඳව සැලකිය යුතු මට්ටමේ තොරතුරු ප්‍රමාණයක් අනාවරණය කර ගෙන ඇත. ඒ අනුව එහි දත්ත පහත ආකාර වෙති.

| වනාන්තර ආකාරය | ප්‍රමාණය (Ha) |
|---|---|
| 1. ප්‍රාථමික වනාන්තර | 5227 |
| 2. ද්විතියික වනාන්තර | 4165 |
| 3. විවෘත තෘණ භූමි | 1486 |
| 4. සැවනා තෘණ භූමි | 7662 |
| 5. පඳුරු හා තෘණ | 3718 |
| 6. පඳුරු | 1683 |
| 7. පඳුරු ආකාර වනාන්තර | 3719 |
| 8. තේක්ක වගාව | 1076 |

මෙයට අමතරව වනෝද්‍යාන සීමාවේ පහත ආකාර පරිසර පද්ධතිද දැකගත හැකිය.

| වනාන්තර ආකාරය | ප්‍රමාණය (Ha) |
|---|---|
| 1. කුඹුරු | 24 |
| 2. ගල්පර | 148 |
| 3. ජලාශ | 3405 |
| | 32313 |

ඉහත ආකාර වූ භූමි ප්‍රමාණයට අයත් පරිසර පද්ධති ආකාර ප්‍රතිශතයක් ලෙසින් ගත් කල,

| | | |
|---|---|---|
| වනාන්තර | – | 57.3% |
| තෘණ භූමි | – | 28.3% |
| ගල්පර | – | 0.5% |
| ජලාශ | – | 10.5% |
| කුඹුරු | – | 0.1 |
| තේක්ක වගාව | – | 3.3% ලෙසින් පෙන්වා දියහැකිය. |

වනෝද්‍යානය තුළ දැකගත හැකි පරිසර පද්ධති වල ඒවාට අයත් ශාක විශේෂ පිළිබඳ කරුණු ද විමසා බැලීම වැදගත් වෙතැයි අදහස් කරමි. ඉන් කිහිපයක් පහත පරිදි පෙන්වාදිය හැකිය.

#### 1. ප්‍රාථමික වනාන්තර

පවුල් 15 ට අයත් විශේෂ 24ක් මෙහි වාර්තා වී (*Drypetes sepiaria*) ඇත. මෙහි ප්‍රමුඛ ශාක ලෙස වීර කුණුමැල්ල (*Diospyros ovalifolia*) කුරටිය (*Memecylon arnottianum*) උල්කෑන්ද (*Polyalthia koriniti*) ප්‍රමුඛස්ථානයක් ගනී.

#### 02. ද්විතියික වනාන්තර

පවුල් 16 ට අයත් විශේෂ 23ක් වාර්තා වී ඇත. බටකිරිල්ල (*Erythroxylum moonii* ) වැලිපැන්න (*Anisophyllea cinnamomoides* ) දෙමට (*Gmelina asiatica* ) වීර (*Drypetes sepiaria*) යනාදී ශාක බහුලය.

#### 03. විවෘත ද්විතියික වනාන්තර

පවුල් 17 ට අයත් ශාක විශේෂ න 31ක් වාර්තා වී ඇත. ඉලුක් (*Imperata cylindrica*) , කටුපිටල (*Securinegaleucopyrous* ) ගඳපාන (*Lantana camara* ) බහුලය.







04. සැවනා

පවුල් 16 ට අයත් ශාක විශේෂ 21ක් වාර්තා වී ඇත. ගිනිග්‍රාස්, (*Panicum maximum*) දමිනිය (*Grewia damine* ) පිල (*Tephrosia purpurea*) Apluda mutica, Chloris montana Eragrostis tenella යනාදී තෘණ වර්ග ද බහුලය.

තවද මෙහි දැකගත හැකි ප්‍රමුඛ වෘක්ෂ අතර මිල්ල, (*Vitex altissima*) බුරුත, (*Chloroxyion swietania* ) කෝන් (*Schleichera oleosa*) ගංගා ආශ්‍රිත ව කුඹුක් (*Terminalia arjuna*) කුණුමැල්ල (*Diospyros ovalifolia* ) කැටකෑල (*Bridelia retusa*) දිවුල් (*Feronia limonia*) මී (*Madhuca longifolia*) තෙලඹු (*Sterculia foetida*) ගොඩකිරිල්ල (*Holpptelea integrifolia*) යනාදී ශාක වැදගත් වෙයි.

මේ අනුව වනෝද්‍යානය ආශ්‍රිතව පවුල් 62 ට අයත් ශාක විශේෂ 135ක් වාර්තා වෙති. මේ අතුරින් විශේෂ 27ක් ඖෂධීය ගුණයෙන් යුතු ශාක වේ. වාර්තා වන ශාක අතුරින් විශේෂ 04න් ලංකාවටම ආවේණිකය. එනම් වලට නිම්නයට ආවේණික මැන්ඩෝර (*Hopea cordifolia*) මෙන්ම වල්පිච්චි (*Jasminum angustifolium*) ඉඳි (*Phoenix zeylanica*) කොර කහ (*Memecylon angustifolium*) යනාදිය එම ශාකය.

ඉහත ආකාර වූ විශාල ශාක විවිධත්වයක් හා පරිසර පද්ධති විවිධත්වයක් උඩවලව වනෝද්‍යානය ආශ්‍රිතව දැකගත හැකිය. මෙම පරිසර පද්ධති වාසස්ථාන කරගෙන දිවිගෙවන වන සතුන්ද බහුලව නිරීක්ෂණය කළ හැකිය.

### වනෝද්‍යානය වාසස්ථානය කරගත් වන සතුන්

උඩවලව වනෝද්‍යානය වඩාත් ප්‍රසිද්ධියක් උසුලනයේ අලි ඇතුන් සම්බන්ධයෙනි. සමාන්‍යයෙන් දවසේ ඕනෑම වේලාවක මෙහි අලි අතුන් නිරීක්ෂණය කළ හැකිය. අලි දැනට මිහිපිට ගොඩබිම ජීවත්වන විශාලම සත්වයෝ ය. වර්තමානයේ ලංකාවේ අලි ඇතුන් 4,000ක් පමණ ජීවත්වන බවට ගණනය කර ඇත. ලෝකයේ ජීවත් වන අලි විශේෂ 05 අතුරින් ලංකාවේ අලියා (Elephuas maximus amximus) පරිමාණාමයෙන් උසස්තමයා ලෙසින් ද මත පලකරති. උඩවලව වනෝද්‍යානය ආශ්‍රිතව ද අලි ඇතුන් 350 -400 ක් පමණ වෙසෙතැයි අධ්‍යයනය කර ඇත.



උඩවලව සුළං කපොල්ල ප්‍රදේශයේ සැරිසරන අලීන්

උඩවලවේ අලි හවස්‍ භාගයේ දී හුළං කපොල්ල නම් ස්ථානයට ජලපානය සඳහා එක් රැස් වෙති. හුළං කපොල්ල වලට ජලාශයේ එක් කොණක පිහිටි තෘණ සහිත ජලය පිරී තැන්නක් ආකාර කොටසකි. මෙම ස්ථානයට රැස්ව අලි රංචු ජලපානයෙන් පසු දෙළිදෙලෙන් ගත කරන ආකාරය නැරඹීම ජීවිතයේ ලද හැකි චමත්කාර ජනකම අත්දැකීමකි.

ශ්‍රී ලාංකික වන සත්ව ලෝලීන් මෙන්ම පිටරැටියන් ද උඩවලවට පැමිණෙන්නේ ප්‍රධාන වශයෙන් ම අලි බැලීම සඳහා ය. එහෙත් උඩවලව වනෝද්‍යානය විවිධ වූ සත්ව කාණ්ඩ සඳහා වාවස්ථානය සපයයි.

වනෝද්‍යානය ආශ්‍රිතව අලින් ද ඇතුළුව ක්ෂීරිපායීන් විශේෂ 46ක් වාර්තා වී ඇත. ඉන් විශේෂ 11ක් ජාතික වශයෙන් ද, විශේෂ 4ක් ජාත්‍යන්තර වශයෙන් ද වඳ වී යාමේ තර්ජනයට ලක් වී ඇත. මෙහිදැකබලා ගත හැකි රිලවා (*Macaca sinica*) හම්බාවා (*Petaursta petaurista* ) , රන් හෝතම්බුවා,(*Paradoxurus zeylonensisi*) කබල්ඇයා (*Manis crassicaudata* ) හා Mus masculus යන මීයන් විශේෂය ද ආවේණික විශේෂ වෙති.

වනෝද්‍යානය ආශ්‍රිතව දිවියන් (*Panthera pardus kotiya*) ඉතාමත්ම අඩු වශයෙන් වාර්තා වෙයි. තවද මෙහි ගෝණා (*Cervrus unicolour*) තිත් මුවා (*Axis asis*) කුළු හරකා (*Bubalus bubalus* ) ඉත්තෑවා (*Hystris indica*) දියබල්ලා (*Lutra lutra* ) නරියා (*Canis aureus* )හඳුන් දිවියා (*Felis viverrina* ) වල් ඌරා (*Sus scrofa*) ඕළු මුවා (*Munitaiacus muntijak*) යනාදී විශේෂ ද ප්‍රමුඛස්ථානයක් ගනිති.



වනෝද්‍යානය ආශ්‍රිතව පක්ෂි විශේෂ 195ක් වාර්තා වී ඇත. ඉන් විශේෂ 30ක් පර්‍යයටණික පක්ෂීහු වෙති. සමස්ත පක්ෂීන්ගෙන් විශේෂ 09ක් ජාතික වශයෙන් වඳවී යාමේ තර්ජනයට ලක්වී ඇත. පක්ෂි විශේෂ 09ක් ශ්‍රී ලංකාවට ආවේණිකය. එම විශේෂ නම් හබන් කුකුළා (*Galloprdix bicalcarata* ) වලි කුකුළා (*Gallus lafayetii* ) මල් කොට්ටෝරුවා (*Megalaima*) වත රතු මල් කොහා(*Phaenicophaeus purrhocephalus*) අළු කෑදැත්තා (*Ocyceros gingalenis*) තිත් පියා තිරා සිකයා (*Zoothera spiloptera*) මුදුන් බොර දෙමලිච්චා (*Pellormeum fuscocapillum* ) හිස කළු කොණ්ඩයා (*Pycnonotus melanicterus*)

තවද මෙහි දැකගත හැකි පක්ෂි වර්ග කීපයක් නම් බහුරු මානාවා, (*Leptoptilus javanicus* ) පැස් තුඩුවා (*Pelecanus phillippensis*) සර්ප රාජාලියා (*Spilornis cheela* ) මුහුදු රාජාලියා (*Haliaeetus leucogaster* ) කළු රාජාලියා (*Ictinaetu malayensis*) ගල් පරවියා (*Calumba livia* ) මහනීලගොයා (*Ducula aenea* ) පතන් ඇටිකුකුළා (Phaenicophaeus *leschenaultii*) උලමා (*Buba nipalensis*) පෝරලුවා (*Upupa epops*) පෙරව කෑදැත්තා (*Anthracoceros coronatus* ) සැලලිහිණියා (*Gracula religiosa*) යන විශේෂ මෙන්ම පර්යටණික විශේෂ අතුරින් දම් පිලිහුඩුවා (*Halcyon pileata*) සුදු හැල පෙන්දා (*Motacilla alba*) අව්ච්චියා (*Pitta brachyura*) සුදු රෙදි හොරා (*Terpsiphone paradisi paradisi*) යන විශේෂ වැදගත් වේ. මෙම සියලු පක්ෂීන් අතුරින් වනපෙතට සිරිගෙන දෙන අලංකාර පක්ෂියා ලෙස මොනරා (*Pava cristutus*) විශේෂ ස්ථානයක් හිමි කර ගනී. සෙබඩක් ඇති තැන පිල් විදහා රඟන මොණරෙකුගේ රැඟුම නෙතට රසඳුනකි.

වනෝද්‍යානය ආශ්‍රිතව සිදුකර ඇති අධ්‍යයන අනුව මෙහි උරග විශේෂ 51ක් වාර්තා වී ඇත. මේ අතුරින් විශේෂ 33ක් සර්පයින් වන අතර විශේෂ 18ක් පාද සහිත උරගයින් ය. මින් විශේෂ 07ක් ශ්‍රී ලංකාවට ආවේණික යයි අනාවරණය වී ඇත. ආවේණික උරගයින් නම් තොල විසිතුරු කටුස්සා (*Calotus ceylonensis* ) පලා පොළඟා (*Trimeresurus trigonocephalus*) පිණුම් කටුස්සා (*Otocryptis wiegmannii*), (*Rhinophis oxyrhynchus*), Hemidactylus triedus) (*Lankascinus fallas*) දෙපත් නයා (*Cylindrophis maculatus* ) යන විශේෂයන්ය. තවද මෙහි කිඹුලා (*Crocodylus porosus*) නයා (Naja naja) පිඹුරා (*Python molurus* ) තිත් පොළඟා (*Daboia pulchera* ) දෙපත් කළුවා (*Calliophis melanurus* ) තාරකා ඉබ්බා (*Geochelone elegans*) යන උරග විශේෂ ද දැකගත හැකිය.

වනෝද්‍යානය ආශ්‍රිත ජලවහන පද්ධතිය පිළිබඳව විග්‍රහයේ දී මෙහි පිහිටි ජලාශ, ගංගා, ආරවල්, ඔයවල් හා පොකුණු පිලිබඳව සවිස්තරාත්මක සටහන් තබන ලදී. මෙම මිරිදිය ජල සංචිතයන් ආශ්‍රිතව මත්ස්‍යයෝද ජීවත් වෙති. දැනට මෙහි මිරිදිය මසුන් විශේෂ 30ක් වාර්තා වී ඇත. මෙයින් විශේෂ 05ක් ශ්‍රී ලංකාවට ආවේණික වෙති. මෙම ආවේණික විශේෂ නම් ආර (*Channa ara* ) රැවුල් දණ්ඩියා (*Esomus thermoicus*) ගල් පාඩියා(*Garra ceylonesis*) ඉපිලි කඩයා(*Puntius bimaculatus*) දත්කොල පෙතියා(*Puntius filamentosus*) යන විශේෂයන්ය. තවද මෙහි වලයා (*Wallago attu*) ලූලා (*Channa striata*) පොල්මල් ආදා (*Anguilla nebulosa* ) ලෙහෙල්ලා (*Tor khudree* ) ආදීන් මෙන්ම ලංකාවට හඳුන්වා දුන් මසුන් වන තිලාපියා (*Oreochromis niloticus* ) කැටියා (*Catla catla*) කාප් (*Cyprinus carpio*) රෝහු (*Labeo rohita*) යන විශේෂයන් ජලාශය ආශ්‍රිතව දැකගත හැකිය.

වනෝද්‍යානයේ සිදුකළ අධ්‍යයන ඇසුරෙන් උභය ජීවි විශේෂ 17ක් හඳුනාගෙන ඇති අතර ඉන් විශේෂ 03ක් ලංකාවට ආවේණිකය. අතුකෝරල ගුරුගෙම්බා (*Bufo atukoralei*) තුන්හිරි වැලි මැඩියා (*Tomopterna breviceps* ) පටල රහිත ඇටකිත්තා (*Philautus hypomelus*) එම විශේෂ 03යි.

උඩවලව වනෝද්‍යානය ආශ්‍රිතව සමනළ විශේෂ 135ක් වාර්තා වෙති. ඉන් විශේෂ 16ක් ශ්‍රී ලංකාවට ආවේණිකය. මෙම ආවේණික විශේෂ නම් Tree Nymph (*Idea lyceus*), Common Indian crow (*Euploea core*), Clipper (*Parthenos sylvia*), The Commander (*Limenitis procris*), Blue Oak leaf (*Kallima philanchus*), The Cruiser (*Vindula erota*), Tamil Lace wing (*Cethosia nietneri*), Little Orange tip (*olotis etrida*), kLarge Bird Wing (*Troides helena*), Ceylon







Rose (*Polydonus jophon*), Common Mime (*Chilasa clytia*), Blue Mormon (*Papilio polymnestor*), Ceylon Snow Flat (*Tagiades gapetus*), Hedge Hpper (*Baracus vittatus*), Decorated Ace (*Halpe decrata*), Common Palm Fly. (*Elymnias hypermeestra*).

උඩවලව ජාතික වනෝද්‍යානය පෙර විස්තර කරන ලද ආකාරයේ විශාල ජෛව විවිධත්වයට උරුමකම් කියන අප සතු ඉහළ අගයකින් යුතු වනජීවි කලාපයකි. මෙම සියලු ජීවි අජීවි සංඝටකයන් හි පැවැත්ම පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් නොමැති වුවද බොහෝ පිරිස් වනෝද්‍යානය නැරඹීමට පැමිණෙති. ඒ අතර පාසල් සිසුහු, විශ්ව විද්‍යාල සිසුහු, වෙනත් අධ්‍යයන ආයතන සිසුහු පරිසරවේදීහු මෙන්ම පොදු ජනතාව යන විවිධ තරාතිරමේ කණ්ඩායම් වෙති. මේ අනුව මෙහි ඇති සංචාරක පහසුකම් පිළිබඳව ද යම්කිසි විමසීමක් කිරීම සුදුසු වෙතැයි සිතමි.



තනිව සරණ තනි අලියෙක්

## වනෝද්‍යානය ආශ්‍රිත සංචාරක පහසුකම්

ජාතික වනෝද්‍යානයක් යනු මහජනතාව සඳහා විවෘත වනජීවි කලාපයන්ය. වනෝද්‍යානයකට ඇතුළු වීමේ දී එහි පිවිසුම් දොරටුවෙන් වනජීවි සංකරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඇතුළුවීමේ අවසර පත්‍රයක් නියමිත ගාස්තුව ගෙවා ලබාගත යුතුය. එසේ නොමැතිව වනෝද්‍යානයට ඇතුළු වීම නීතිවිරෝධී කටයුත්තකි.

උඩවලව වනෝද්‍යනය තුළ සංචාරකයන්ගේ නවාතැන් පහසුව සඳහා සංචාරක බංගලා කීපයකි. ඒවා නම් සීනුන්ගල, තිඹිරිගස්මංකඩ, වෙහෙරගොල්ල හා ගෝණවිද්දගල ය. තවද මෙහි කඳවුරු බිම් 02ක් ද වෙති. ඒවා නම් පන්සදාර හා වෙහෙරමංකඩය. පන්සදාර යනු කුඩා ආරවල් පහක් එකට එකතුවන ස්ථානය යන්න හැඟවෙන අරුතක් ඇතිව පටබැඳුනු නමකි. වලව හං ඉවුරේ පිහිටි මෙම කඳවුරු බිම් ඉතාමත්ම සුන්දර ස්ථානයන්ය. වනජීවි බංගලා හා කඳවුරු බිම් වනජීවි සංකර්ෂණ දොපර්තමේන්තුවෙන් වෙන්කරවා ගත යුතුය. මෙහි වනසතුන් නිරීක්ෂණය කරන්නනන්ගේ පහසුව සඳහා පෞද්ගලික ජීප් රථ සේවාවක් පවත්වාගෙන යන අතර එහි ගමන් කරන්නනන්හට වනජීවි දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ මාර්ගෝපදේශක සේවාව ලබාගත යුතුය. තමන් සතු පෞද්ගලික වාහනයකින් වනෝද්‍යානයට ඇතුලුවීමේ දීද වනජීවි නිලධාරියෙකුගේ මාර්ගෝපදේශකත්වය ලබාගත යුතුය.

උඩවලව වනෝද්‍යාන සංචාරයට පැමිණි සංචාරකයින් ප්‍රමාණ පිළිබඳ සලකා බැලීමේ දී (වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුව) පහත ආකාර වේ.

කෙසේ නමුත් උඩවලව වනෝද්‍යානය නැරඹීමට පැමිණෙන පිරිස දිනෙන් දින ඉහළ යති. මේ අතර විවිධ මානසික මට්ටම්වල පිරිස් වෙති. සමහරුන් පරිසර ලෝලීන්ය. සමහරෙක් හුදෙක් විනෝදාස්වාදය පමණක් අරමුණු කරගත් පිරිස්ය: මෙම තත්වය හමුවේ වනෝද්‍යානයේ නිතිරීති පිලිබඳව ද වඩාත් සැළකිලිමත් විය යුතුය.

## වනෝද්‍යාන ආශ්‍රිත පවතින ගැටලු සහ සංකර්ෂණය

ශ්‍රී ලංකාවේ පිහිටි වනෝද්‍යාන අතරින් වැඩිම ගම්මාන ප්‍රමාණයකටම මැදිව පිහිටි වනෝද්‍යානය උඩවලව වනෝද්‍යානයයි. මේ හෙයින් මේ ආශ්‍රිත ව පවතින ගැටළු ද බහුලය. එම ගැටළු කරුණු වශයෙන් පහත සඳහන් අයුරින් ඉදිරිපත් කළ හැකිය.

* වන විනාශය
* අනවසර හේන් වගාව
* කැලෑ සහ තෘණ භූමි ගිනි තැබීම
* මැණික් ගැරීම
* ගංජා වගාව
* වනසත්ව දඩයම
* අනවසර පදිංචිය
* වනෝද්‍යානයට ගවයන් ඇතුළු කිරීම

වනෝද්‍යානය තුළ පවතින ගැටලු අතරින් හීලෑ ගවයින් වනෝද්‍යානයට ඇතුළු කිරීම විශාල ප්‍රශ්නකාරී තත්ත්වයක් දක්වා ගොඩනැගෙමින්



පවතී. දැනට ගණනය කර ඇති පරිදි උද්‍යානය තුළ හීලෑ ගවයෝ 10,000ක් පමණ සිටිති. මෙම සතුන් තෘණ උලාකෑමෙන් අලි ඇතුන්ට ආහාර නැතිවීමෙන් එම සත්තු ගම් වදිති. එයින් අයතා අලි මිනිස් ගැටුමක් හටගැනීමට හේතුවක් වෙයි. වනෝද්‍යානයට සිදුවන මානව ආවරණ සැබවින් ම එහි ශාක සත්ව ඇතුළු ජෛව විවිධත්ව විනාශයට බලපායි. මෙම කාරණය නැවත මිනිසාටම හානිකර අයුරින් බලපායි. මේ අතරින් අලි මිනිස් ගැටුම ප්‍රබලව ගොඩනැගෙන ගැටලුවකි. මෙහිදී අලින්ටත් මිනිසුන්ටත් එකසේ හානිකර තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වේ.

මෙහි දැකගත හැකි සංරක්ෂණ ක්‍රියාකාරකම් අතර ඒ වටා ජීවත්වන පාසල් සිසුන් ඇතුළු ප්‍රජාව දැනුවත් කර ඔවුන්ට ප්‍රායෝගිකවම සංරක්ෂණ කාර්යයන් සඳහා යොදාගැනීම ප්‍රමුඛස්ථානයක් ගනී. තව ද වනෝද්‍යානයේ මායිම් කීපයක ඇති විදුලි වැට තවදුරටත් ව්‍යාප්ත කිරීම අලි මිනිස් ගැටුම අවම කිරීමට හේතු විය හැකිය. දැනට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් අල්ලා ගන්නා දරුණු අලින් ද වැඩි වශයෙන් උඩවලව මුදා හරියි. වනෝද්‍යානයේ ප්‍රධාන කාර්යාලය අසල වලව ජලාශය ආශ්‍රිත භූමි භාගයේ පවත්වාගෙන යන ඇත් අතුරු සෙවන අනාථ වන අලි පැටවුන්ට ආරක්ෂාව සපයනු ලබයි. එම පැටවුන් නැවතත් කැලයට මුදා හරිනු ලබයි. නැවතත් මුල් නිජබිම කරා පිය නැගුමට යන තේමා පාඨය යටතේ ක්‍රියාත්මක ඇත් අතුරු සෙවන 1995 දී කොමළී නම් එක් අනාථ අලි පැටවෙකුගෙන් ආරම්භ වූවකි. දැනට තෙවරකට පැටවුන් 16 දෙනෙකු පමන මෙහි ඇති දැඩි කර තිසි වයසට එළඹුණු පසු කැලයට මුදා හැර ඇත. වනෝද්‍යානය තුළ පිහිටි කුඩා ඔය ආශ්‍රිත පරිසරය ශාක සහ සත්ව විවිධත්ව අතින් ඉහළ තත්ත්වයක පවතී. එහෙයින් එම ප්‍රදේශය වෙනමම ජාතික වනෝද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත්කළ යුතු යැයි උඩවලව වනෝද්‍යාන කළමණාකරන සැලසුම් අංක 01 (Management Plan - Udawalawe National Park - Volume 01) යටතේ පෙන්වා දී ඇත.

තවද වනෝද්‍යානයේ සංරක්ෂණය අරමුණු කරගෙන පහත සඳහන් ක්‍රියාකාරකම් ද තහනම් වෙති.

* අනවසර ඇතුලුවීම සතුන්ට හෝ ශාකවලට හානි කිරීම
* පුපුරන ද්‍රව්‍ය හෝ ගිනි අවි රැගෙන යාම
* සතුන් දඩයම් කිරීම, මැරීම
* සජීවි හෝ අජීවි සත්ව කොටස් ශාක කොටස් එකතු කිරීම
* හීලෑ සතුන් ඇතුළුකිරීම හො නිදැල්ලේ හැසිරීමට ඉඩහැරීම
* ඉඩම් හෙළිකිරීම, පාරවල් සෑදීම හෝ ගොඩනැගිලි තැනීම
* පුරාවිද්‍යාත්මක භූගෝල විද්‍යාත්මක හෝ ජෛව විද්‍යාත්මක වටිනාකමකින් යුත් ද්‍රව්‍ය ඉවත් කිරීම
* වනජීවී සංකර්ෂණ දෙපාර්තමේන්තුවේ අවසර පතක් මග පෙන්වන්නෙක් නොමැතිව වාහන ඇතුළු කිරීම

උඩවලව ජාතික වනෝද්‍යානය සම්බන්ධ ජෛවීය,ඓතිහාසික සමාජයීය හා සංකරක්ෂණ ක්‍රියාවලින් ඇතුළු අදාළ කරුණු විශාල ප්‍රමාණයක් මෙම ලිපිය තුළින් අනාවරණය කරන ලදී. අප සතු ඉතාමත්ම වටිනා වනෝද්‍යානයක් වන උඩවලව ජාතික වනෝද්‍යානයේ අනාගත සංකරක්ෂණය පිළිබඳ හරවත් අදහසක් මේ ලිපයෙන් ඇතිකර ගන්නේ නම් එය මගේ අභිලාෂය ඉටුවුවායයි සලකමි.

| *උද්‍යාන මායිම* | | *ගම්මාන* |
|---|---|---|
| බටහිර මායිම | 1. | මහආර |
| | 2. | පනහඩුව |
| | | බෙන්වන්ගල |
| | | පනහඩුව කුඩා |
| | | ගුරුමාදයාය ගම්මාන |
| | | කොළම් මණ්ඩිය |
| | 3. | තැලිගම යාය |
| | 4. | වෙලන්කැටිය |
| | 5. | ගල්පාය |
| | 6. | බිසෝ කොටුව |
| | 7. | වෙහෙර බැන්ද යාය |
| | 8. | බඹරගල |
| | 9. | තෙලඹුගහ අතුර |
| | 10. | ලේකේල්ගලයාය |
| | 11. | දික්යාය |
| | 12. | පළුගහවෙල |
| | 13. | කරවිලයාය |
| | 14. | හටන්ගල |
| | 15. | කොට්ටිඹුල් වල |
| උතුරු මායිම | 16. | හඳගිරිය |
| | 17. | හැඳගිරිගොඩ |







18. කපුගල
19. ඉත්තගල යාය(උද්‍යානය තුළ)
20. දොරවෙල ලන්ද
21. කඳුරුව
22. දියවින්න
23. පුබ්බරපොතයාය
24. ඇල්ලේපොළ යාය
25. කළුපේඩි ගම
26. කොන්ගස්මංකඩ
27. දම්වැල්ඕඩය
28. පොතුපිටිය
29. පොකුණු තැන්න

නැගෙනහිර මායිම
30. කොටවෙහෙර මංකඩ
31. කුකුල් කටුව
32. වටමඩ
33. රතඹලාගම
34. හම්බෙගමුව
35. හම්බෙගමුව ජනපදය
36. බිංගල
37. අරඹේකෙම
38. කහ කුරුල්ලන් පැලැස්ස
39. කිවුල
40. කලවැල්ගහ
41. මහවැව
42. 23 කොලනිය
43. නවසිරිපුර
44. විජේපුර

දකුණු මායිම
45. දාහතහමාරේ ගම (17 1/2)
46. පහලවාමාරේ ගම (15 1/2)
47. නෙලුම් වැව
48. නෙළුම්සිරිගම
49. මයුරගම (දහයේ කණුව)
50. හඹරළු ආර
51. සම්පත් ගම
52. එකමුතුගම

ශ්‍රී ලාල් නිශාන්ත හෙට්ටිආරච්චි,
වැඩ සටහන් නිලධාරී,
ශ්‍රී ලංකා වනජීවී භාරය.